සැ. යු.- 2010.06.11 දින පළ වූ අංක 1,658 දරන *ගැසට් පත්‍රයේ* I-III, II සහ III කොටස් පළ නොවීය.
මෙම *ගැසට් පත්‍රයේ* දෙමළ අනුවාදයන් වෙනම මුද්‍රණය කෙරේ.
මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2009 වර්ෂයේ පශු වෛද්‍ය නිලධාරීන්ගේ නාමලේඛණයක් ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,659 - 2010 ජුනි මස 18 වැනි සිකුරාදා - 2010.06.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 1226 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීත් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මීත් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජුනි මස 24 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජුනි මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

සංශෝධනය

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරුවලට බඳවා ගැනීම**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීමේ නිවේදනයේ අයැදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2010.06.30 දක්වා දීර්ඝ කළ බව අයැදුම්කරුවන් වෙත මෙයින් දන්වමි.

| *බඳවා ගන්නා තනතුර* | *පළ කර ඇති ගැසට් පත්‍රය* |
|---|---|
| 1. *III වැනි පන්තියේ II ශ්‍රේණියේ බදු නිලධාරි තනතුරට බඳවා ගැනීම*<br>2. *II වැනි පන්තියේ II ශ්‍රේණියේ තක්සේරුකරු තනතුරට බඳවා ගැනීම* | *2010.05.07 දින අංක 1653 - කොටස IV (අ)* |
| 3. *ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීම*<br>4. *ග්‍රාම සංවර්ධන නිලධාරි II පන්තියට බඳවා ගැනීම*<br>5. *සමුපකාර සංවර්ධන නිලධාරි III පන්තියට බඳවා ගැනීම* | *2010.05.21 දින අංක 1655 - කොටස IV (අ)* |

එමෙන්ම III වැනි පන්තියේ II ශ්‍රේණියේ බදු නිලධාරි තනතුරට බඳවා ගැනීමේ නිවේදනයේ අධ්‍යාපන සුදුසුකම්වල 3 ඡේදයේ "අ" වගන්තිය පහත පරිදි සංශෝධනය විය යුතුය:—

ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම හෝ වරලත් ගණකාධිකාරි ආයතනයේ මධ්‍ය පරීක්ෂණය සමත්වීම හෝ ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණය හෝ වාණිජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ මධ්‍ය පරීක්ෂණය සමත්වීම හා පහත සඳහන් පරිදි අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ද්විතීය භාෂාවකින් සාමාර්ථයක් ලබා තිබීම :

| | | |
|---|---|---|
| * සිංහල මාධ්‍යයෙන් පෙනී සිටින අයැදුම්කරුවන් | - | දෙමළ හෝ ඉංග්‍රීසි විෂයය |
| * දෙමළ මාධ්‍යයෙන් පෙනී සිටින අයැදුම්කරුවන් | - | සිංහල හෝ ඉංග්‍රීසි විෂයය |
| * ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිටින අයැදුම්කරුවන් | - | සිංහල හෝ දෙමළ විෂයය |

***බඳවා ගැනීමේ විභාගවල විෂය නිර්දේශය පහත සඳහන් පරිදි වේ :-***

III වැනි පන්තියේ II ශ්‍රේණියේ බදු නිලධාරි තනතුරට බඳවා ගැනීම

* සාමාන්‍ය දැනීම - ශ්‍රී ලංකාව ආශ්‍රිතව දේශපාලන, ආර්ථික හා සමාජයීය කරුණු පිළිබඳ සාමාන්‍ය දැනීම ප්‍රශ්න පත්‍රයක්
* බුද්ධි පරීක්ෂණය - පද සංඛ්‍යා, රූප හා ගණිතමය වශයෙන් ඉදිරිපත් කරන ගැටලු ආශ්‍රිත ප්‍රශ්න පත්‍රයක්.

***II වැනි පන්තියේ II ශ්‍රේණියේ තක්සේරුකරු තනතුරට බඳවා ගැනීම***

* සාමාන්‍ය දැනීම - ශ්‍රී ලංකාව ඇතුළුව ලෝකය ආශ්‍රිතව දේශපාලන ආර්ථික හා සමාජයීය කරුණු පිළිබඳ සාමාන්‍ය දැනීම ප්‍රශ්න පත්‍රයක්
* බුද්ධි පරීක්ෂණය - අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල තත්ත්වයත් ඔහුගේ සිතෙහි විශ්ලේෂණ තත්ත්වයත් තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා සකස් කළ ප්‍රශ්න පත්‍රයක්. (පද සංඛ්‍යා, රූප හා ගණිතමය ගැටලු ආශ්‍රිත ප්‍රශ්න ඇතුළත් කෙරේ.)
* අවබෝධය - පාඨයන්ගේ අර්ථය වටහා ගන්නා ආකාරය පරීක්ෂා කිරීම සඳහා වාක්‍ය කීපයක් එක් වාක්‍යයකින් ප්‍රකාශ කිරීම, සාරාංශ කිරීම. ඊට අමතරව ඡේදයක් ඇසුරෙන් සකස්කරන ප්‍රශ්නවලින් සමන්විත වේ.

වී. රාජපක්ෂ,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2010 ක් වූ ජුනි මස 07 වැනි දින,
බස්නාහිර පළාතේ,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දී ය.

06-661

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.